# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,734 — 1959 අප්‍රේල් 30 වැනි බ්‍රහස්පතින්ද — 30.4.1959

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරනු ලදී)

# IV වැනි කොටස—පළාත් පාලනය

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)

| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | 411 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | — |
| තනතුරු-ඇබෑර්තු ... ... | — | අය-වැය ලේඛන ... ... | 412 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | දේපල විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවසථා ... ... | — | මාගී කොමිටි දැන්වීම් ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... ... ... | — | විවිධ දැන්වීම් ... ... | 412 |

## පළාත් පාලන නිවේදන

ඇල්.ඕ.—බී 59/48.

ඇල්.ජී.ඕ.—ජීඅයි 3/17.

### ගම්සභා ආඥාපනත

1947ක්වූ සැප්තැම්බර් මස 24 වෙනි දින අංක 9,773 දරණ අතිරේක් ගැසට් පත්‍රයේ පළකරන ලද ප්‍රකාශනයෙන් සංශෝධිත ගම්සභා ආඥාපනතේ (198 වෙනි පරිච්ඡෙදයේ) 53 (1) දරණ වගන්තිය යටතේ මුදල් පිළිබඳ අමාත්‍යතුමාගේ එකගත්වය ඇතිව පළාත් පාලනය හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුවේ ප්‍රාදේශික ආදායම් පාලක නිලධාරියාගේ කොට්ඨාශයේ කුළුගම්මනසියපත්තු ගම් ප්‍රදේශයේ ගම්කායර්‍ය සභාව විසින් සම්මත කර ගන්නා ලදුව, මීට යා කොට ඇති උපලේඛනයේ සඳහන් යෝජනාව අනුමත කරන ලද බව මෙයින් දෙනු ලැබේ.

ඇන්. කියු. ඩයස්,
පළාත් පාලනය හා සංස්කෘතික කටයුතු භාර අමාත්‍ය කායර්‍යංශයේ වැඩබලන ස්ථාවර ලේකම්.

වර්ෂ 1959ක්වූ අප්‍රේල් මස 13 වෙනි දින,
කොළඹදීය.

411—ජේ. ඇන්. බී. 13188—3,307 (4/59)

## උපලේඛනය

### යෝජනාව

මෙම යෝජනාව අනුමතකිරීම ගැසට් නිවේදනයකින් දැනුම් දෙනු ලබන දින සිට මෙහි පහත සඳහන් තොටුපල් ගාස්තු ගොහාගොඩ තොටුපලෙන් අය කළ යුතුයයි හාරිස්පත්තුවේ කුළුගම්මනසියපත්තු ගම් ප්‍රදේශයේ ගම්කායර්‍ය සභාව යෝජනා කරන්නීය:—

| | රු. | ශ. |
|---|---|---|
| එක් අශ්වයෙකුට ... ... | 0 | 30 |
| එක් ගවයෙකුට ... ... | 0 | 25 |
| එක් එළුවෙකුට හෝ ඌරෙකුට ... ... | 0 | 15 |
| එක් අලියෙකුට ... ... | 0 | 50 |
| එක් බයිසිකලයකට ... ... | 0 | 20 |
| එක් කරත්තයකට ... ... | 0 | 50 |
| එක් මෝටර් සයිකලයකට ... ... | 0 | 50 |
| ඉහත සඳහන් යන්ත්‍රයකින් හෝ වාහනයකින් බාහිර වූ වෙනත් යන්ත්‍රයකට හෝ වාහනයකට ... | 0 | 50 |
| බඩු— | | |
| (ඒ) යම් බඩු බාහිරාදියක බර හොණ්ඩර 5කට වඩා අඩුවූ විට එක් එක් හොණ්ඩරයකට හෝ ඉන් කොටසකට ... ... | 0 | 10 |
| (බී) යම් බඩු බාහිරාදියක බර හොණ්ඩර 5කට වඩා අඩු නොවූ විට එහෙත් හොණ්ඩර 10කට වඩා වැඩි නොවූ විට ... ... | 1 | 0 |
| (සී) යම් බඩු බාහිරාදියක බර හොණ්ඩර 10කට වඩා වැඩිවූ විට එයින්— | | |
| (1) පළමුවෙනි හොණ්ඩර 10ට ... | 1 | 0 |
| (2) ඉන් වැඩි වෙන එක් එක් හොණ්ඩර 1ට හෝ ඉන් කොටසකට ... | 0 | 10 |
| එක් මගියෙකුට ... ... | 0 | 05 |

# අය-වැය ලේඛන

## හොරණ පළාත් ආණ්ඩු සභාව

### 1959 වර්ෂයේ පළමුවැනි අතිරේක අය-වැය ලේඛනය

| ශීර්ෂය | මුදල රු. ශ. | | අවසරය |
|---|---|---|---|
| ඒ. සාමාන්‍ය වියදම :— | | | |
| (2) කාර්යමණ්ඩලීය වියදම්— | | | |
| (අයි) ගණකාධිකාරී ගාස්තු ... ... ... | 367 | 0 | ... 7.2.59 වන දින යෝජනා අංක 9 (බී) |
| (ඇල්) අතිකාල දීමනා ... ... ... | 50 | 0 | ... 7.2.59 වන දින යෝජනා අංක 4 |
| බී.—මහාමාර්ග :— | | | |
| (7) සතුකොට ගැනීම ... ... ... | 400 | 0 | ... එම |
| (8) සංවර්ධන කටයුතු ... ... ... | 1,312 | 0 | ... 4.4.59 වන දින යෝජනා අංක 12 (ඇ) |
| (11) මැනීම ... ... ... ... | 100 | 0 | ... 7.3.59 වන දින යෝජනා අංක 5 |
| සී.—තානායම් සහ අම්බලම් :— | | | |
| (4) සංවර්ධන කටයුතු ... ... ... | 4,500 | 0 | ... 7.2.59 වන දින යෝජනා අංක 8 |
| ඩී.—නගර සභා ඉඩම් හා ගොඩනැගිලි (අන් තැනක වැය නොවන) :— | | | |
| (4) නඩත්තු කිරීම ... ... ... | 170 | 0 | ... 4.4.59 වන දින යෝජනා අංක 9 |
| ඊ.—මහජන සනීපාරක්ෂාව :— | | | |
| (1) සාමාන්‍ය— | | | |
| (බී) ආධාර ... ... ... | 276 | 0 | ... 7.2.59 වන දින යෝජනා අංක 3 |
| (6) ආරෝග්‍යශාලා— | | | |
| (බී) නඩත්තු කිරීම ... ... ... | 25 | 0 | ... 4.4.59 වන දින යෝජනා අංක 9 |
| ජී.—සොහොන් බිම් (සොහොන් බිම් ව්‍යවස්ථාවේ 181 වැනි පරිච්ඡේදය) :— | | | |
| (1) වේතන ... ... ... ... | 100 | 0 | ... 7.2.59 වන දින යෝජනා අංක 9 (ඒ) |
| ජේ.—විදුලිය බල කාර්යාංශය :— | | | |
| (2) ප්‍රතිසංස්කරණ හා නඩත්තු— | | | |
| (සී) විදුලි මානක යන්ත්‍ර, යාන්ත්‍රික ඇන හා අනෙක් උපකරණ ... | 1,345 | 0 | ... 4.4.59 වන දින යෝජනා අංක 7 |

1959 පෙබරවාරි මස 7 වෙනි දින, 1959 මාර්තු මස 7 වෙනි දින සහ 1959 අප්‍රේල් මස 4 වෙනි දින පවත්වන ලද රැස්වීම්හිදී සම්මත කැරිණි.

17.4.59
පළාත් ආණ්ඩු සභා කාර්යාලය,
හොරණ.

ඩබ්ලිව්. ඇම්. පොන්සේකා,
සභාපති.
හොරණ පළාත් ආණ්ඩු සභාව.

---

# විවිධ දැන්වීම්

## රයිගම් උඩුගහපත්තු ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අය එහි සඳහන් ස්ථාන යෙහි 1959යේ වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා බලපත්‍ර ඉල්ලා අයදුම්පත් මා වෙත එවා තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වෙනි පරිච්ඡේදයේ 1947 අංක 44 දරණ සංශෝධිත ආඥාපනතේ 6 වෙනි වගන්තියෙන් සංශෝධන කරනලද 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. එකී බලපත්‍ර නිකුත්කිරීම ගැන උඩුගහපත්තු ගම් ප්‍රදේශයේ ගම් කාර්ය සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇ එසේ විරුද්ධ වන්නේ කුමන හේතූන් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට 14 දිනක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දන්වා සිටිමි.

### උපලේඛනය

(1) ඉල්ලුම්කරුගේ නම: සී. ඇල්. ඇම්. කාලිදු, ඉංගිරිය ; ස්ථානය : නො. 181, මිල්ලගහවත්ත, ඉංගිරිය—කඩ මණ්ඩිය ; වෙළඳාම ; හරක් මස්.

ඩී. ඇම්. ගුණතිලක,
උඩුගහපත්තු ගම්කාර්ය සභාවේ ප්‍රධාන තැන.

ගම්සභා කාර්යාලය, පෝරුවදණ්ඩ,
20.4.59.